# සංස්කෘත භාෂාවේ ප්‍රයෝජ්‍ය ක්‍රියාව

- ආචාර්ය කණුමුල්දෙණියේ චන්දසෝම හිමි

සංස්කෘත භාෂාවේ ක්‍රියාවන් වර්ග දෙකකට බෙදේ. එනම් ප්‍රාථමික ක්‍රියා හා අප්‍රාථමික ක්‍රියා වශයෙනි. ප්‍රාථමික ක්‍රියා ගණයට ගැනෙන්නේ දශ ලකාර පද්ධතියයි. එම ලකාරයන් ද කොටස් දෙකකට නැවත බෙදේ. එනම් කාලවාචී හා ප්‍රකාර වාචී වශයෙනි.

කාලවාචී ලකාර (tenses)

ලට් - වර්තමාන කාලය

ලිට් - නොදුටු (පරෝක්ෂ) අතීත කාලය

ලඞ් - ඈත (අනද්‍යතන) අතීත කාලය

ලුඞ් - සමීප (අද) අතීත කාලය

ලෘඞ් - අතීත/ අනාගත ක්‍රියාතික්‍රම (සම්භාව්‍ය) කාලය

ලුට් - හෙට (ශ්වස්තනී) අනාගත කාලය

ලෘට් - අනාගත කාලය

ප්‍රකාරවාචී ලකාර (moods)ඃ

ලෝට් - ආඥාව හා ප්‍රේරණය

විධිලිඞ් - විධාන හා සම්භාවනා

ආශිර්ලිඞ්- ආශිර්වාදය වශයෙනි.

සංස්කෘත ව්‍යාකරණයේ ලකාර නම් වූ ප්‍රාථමික ක්‍රියාවන්ට අමතරව අප්‍රාථමික (ද්විතීයික) ක්‍රියා පද්ධතියක් ද ඇත. එම ක්‍රියාවන්හි විශේෂ ලක්ෂණය නම් ධාතුවට විශේෂ ප්‍රත්‍යයක් එක්කොට ද්විතීයික ධාතු අංගයක් හෙවත් ක්‍රියා අංගයක් නිර්මාණය කරගැනීමයි. එවැනි අප්‍රාථමික ක්‍රියා කොටස් 04 කි. එනම්

1. ණිජන්ත (ප්‍රයෝජ්‍ය) ක්‍රියා
2. සාන්ත (ඉච්ඡාර්ථ) ක්‍රියා
3. යඞන්ත (අතිශයාර්ථ) ක්‍රියා
4. නාමධාතුක (නාම ක්‍රියා) ක්‍රියා වශයෙනි. මෙහිදී ණිජන්ත ක්‍රියා පිළිබඳ අධ්‍යයනය කෙරේ.

මේ ණිජන්ත ක්‍රියා ප්‍රේරණාර්ථක ක්‍රියා (සාරස්වතෙහි 'ධාතෝඃ ප්‍රේරණේ') නමින් ද හැඳින්වේ. ණිජන්ත නාමය මීට යෙදෙනුයේ එම ක්‍රියා පදය සඳහා යොදනු ලබන ප්‍රත්‍යයේ නාමය නිසාවෙනි. එනම් 'ණිච්' (ණිච් අන්ත- ණිජන්ත) වේ. 'ණ්ච්' යනු ඉත් සංඥකයි. එනම් ධාතුවෙන් පසු 'ඉ' ප්‍රත්‍යය යෙදීමේදී ධාතුවේ ස්වරයන්ට ඇතැම්විට ගුණවීම හෝ වෘද්ධි වීම එයින් දැක්වේ. මෙම ණිච් ප්‍රත්‍යය ක්‍රියා ධාතුව සමග එක්වීමේදී ඉතිරි වන්නේ 'ඉ' පමණකි. එම 'ඉ' යන්න 'අය' බවට පසුව පත්වේ. ණිජන්ත නාමය යොදනු ලැබ ඇත්තේ පාණිනී විසිනි. මෙම ක්‍රියා විධියම සාරස්වත ව්‍යාකරණයෙහි 'ඤ්‍යන්ත' (ඤ්‍යන්තාඃ) නමින් හැඳින්වේ. සාරස්වතෙහිදී මේ ක්‍රියා විධියේ ප්‍රත්‍යය සඳහන් වන්නේ 'ඤි' නමිනි. (ප්‍රයෝජකව්‍යාපාරේ'ථෙ ධාතෝර් ඤිඃ ප්‍රත්‍යයෝ භවති- සාරස්වත) 'ඤ්‍යන්ත' නාමයට වඩා 'ණිජන්ත' නාමය බහුල වශයෙන් භාවිත වන බැවින් මෙහිදීද එම නාමය භාවිත කෙරේ. ආතර් ඒ. මැක්ඩොනල් 'ආධුනික සංස්කෘත ව්‍යාකරණ' ග්‍රන්ථයේදී ඉහත දැක් වූ ක්‍රියා විධි සිව් කොටසම 'උද්ධාරක ක්‍රියා' (Derivative verbs) වශයෙන් නම් කොට එහි ණිජන්ත ක්‍රියා 'ප්‍රයෝජක ක්‍රියා' (Causatives) ලෙස නම් කොට



ඇත. එම්. එච්. එෆ්. ජයසූරිය මහතා ඉහත දැක් වූ අප්‍රාථමික ක්‍රියා සියල්ල දක්වා ඇත්තේ 'ප්‍රත්‍යයාන්ත ක්‍රියා හෙවත් අප්‍රාථමික' වශයෙනි. මේ ක්‍රියා විශේෂය ප්‍රයෝජ්‍ය ක්‍රියා නමින් ද ප්‍රකටයි. කෙසේ වුවද ඉහත දැක් වූ ප්‍රේරණාර්ථක නම් ක්‍රියාව මෙහෙයවන්නාගේ නියෝගය හෙවත් ආඥාව, මෙහෙයවීම අදහස් කෙරේ. (කුර්වන්තං ප්‍රේරයති යඃ ස ප්‍රයෝජකඃ) ශ්‍රී පියරතන මාහිමි එම ප්‍රේරණය කොටස් කීපයකට බෙදා දක්වයි. එනම්

1. ප්‍රේරණ- තමන්ට හීන වූ දාසාදීන් කෙරෙහි පැවැත්විය යුතු ආඥාව
2. අධ්‍යෙෂණ- ආචාර්‍යාදී තමන්ට වැඩිහිටියන් කෙරෙහි පැවැත්විය යුතු ප්‍රාර්ථනය
3. තත්සමර්ථාචරණ- මෙහෙයවන්නාගේ ක්‍රියාවට අනුකූලව ක්‍රියා කිරීම වශයෙනි. ඒ අනුව ඒ සියලු අවස්ථාන්හි මේ ක්‍රියා විශේෂය වෙනසක් නැතිව භාවිත කළ හැක.

- ක්‍රියාව නිර්මාණය වන්නේ මෙසේය. ධාතුවට හා ප්‍රත්‍යයට අතර 'අය' ප්‍රත්‍යය එකතු වේ. එසේම ප්‍රයෝජ්‍ය ක්‍රියාංගය 'අ' යන්නෙන් අවසන් වේ. පහත උදාහරණවලින් පැහැදිලි වේ.

| ධාතුව හා ප්‍රත්‍යයඃ | ක්‍රියා අංගයඃ | ලට් | ලඞ් | ලෘට් |
|---|---|---|---|---|
| පච්+අය | පාචය | පාචයති | අපාචයත් | පාචයිෂ්‍යති - පිසවන්නේය |
| ග්‍රහ්+අය | ග්‍රාහය | ග්‍රාහයති | අග්‍රාහයත් | ග්‍රාහයිෂ්‍යති - ගන්වන්නේය |
| ලිඛ්+අය | ලේඛය | ලේඛයති | අලේඛයත් | ලේඛයිෂ්‍යති - ලියවන්නේය |
| ලුප්+අය | ලෝපය | ලෝපයති | අලෝපයත් | ලෝපයිෂ්‍යති - නස්වන්නේය |
| දෘශ්+අය | දර්ශය | දර්ශයති | අදර්ශයත් | දර්ශයිෂ්‍යති - දක්වන්නේය |
| ක්ෂි+අය | ක්ෂායය | ක්ෂායයති | අක්ෂායයත් | ක්ෂායයිෂ්‍යති - ක්ෂය කරවන්නේය |
| භී+අය | භායය | භායයති | අභායයත් | භායයිෂ්‍යති - බිය කරවන්නේය |
| | භීෂය | භීෂයති | අභීෂයත් | භීෂයිෂ්‍යති - බිය කරවන්නේය |
| | භාපය | භාපයති | අභාපයත් | භාපයිෂ්‍යති - බිය කරවන්නේය |

| | | | | |
|---|---|---|---|---|
| ඍ+ අය | රාවය | රාවයති | අරාවයත් | රාවයිෂ්‍යති - හඬවන්නේය |
| ලු +අය | ලාවය | ලාවයති | අලාවයත් | ලාවයිෂ්‍යති - සිඳුවයි |
| කෘ +අය | කාරය | කාරයති | අකාරයත් | කාරයිෂ්‍යති - කරවන්නේය. |
| දෘ +අය | දාරය | දාරයති | අදාරයත් | දාරයිෂ්‍යති - පලවන්නේය |
| ගම්+ අය | ගමය | ගමයති | අගමයත් | ගමයිෂ්‍යති - යවන්නේය (වෘද්ධි නොවේ) |

(මෙහි අර්ථ දක්වා ඇත්තේ ලෘට් ලකාරයේ පමණි).

ඉහත ක්‍රියා දෙස බැලීමෙන් පෙනී යන්නේ ඇතැම් ධාතුන්වලැ පහත සඳහන් වෙනස්කම් සිදුවන බවයි. එනම්

- ධාතුවේ ස්වරය ගුණ විම හෝ වෘද්ධිවිම සිදුවේ. ඒ මෙසේය.

ගුණවිම:

| ස්වර | උ | ඉ, ඊ | උ, ඌ | ඍ, ඎ | ඏ, ඐ |
|---|---|---|---|---|---|
| ස්වර ගුණ | අ | ඒ | ඕ | අර් | අල් |

වෘද්ධිවීම:

| ස්වර | අ, ආ | ඉ,ඊ, ඒ | උ,ඌ, ඕ | ඍ, ඎ | ඏ, ඐ |
|---|---|---|---|---|---|
| වෘද්ධිරූප | උා | ඓ | ඖ | ආර් | ආල් |

- වෘද්ධිවීමෙන් පසු ඓ,ඖ වැනි රූපයන්ට 'ආය්' හා 'ආව්' ආදේශ වීමෙන් පද ගැලපේ.

- ණිජන්ත ක්‍රියා වරනැගෙන්නේ චුරාදි ගණික ක්‍රියා පද මෙනි. එනම් චෝරයති. කථයති, තාඩයති ආදි වශයෙනි. එසේම ඒවා පරස්මෛ පද හා ආත්මනේ පද දෙකෙහිම වරනැගෙන උභය පදී බව ද සැලකිය යුතුය. එසේම ක්‍රියාවෝ සේට් වෙති.



- ඇතැම් ධාතුන්වල ඇතැම් වෙනස්කම් සීමාසහිතව සිදුවේ. ඒ මෙසේය.

*1. ආකාරාන්ත ධාතුන්වල 'අය' ප්‍රත්‍යයට පූර්වයෙන් 'ප' යන්නක් ආගම වේ.*

| ධාතුව | ණිජන්ත ක්‍රියා | ලට් ලකාර ක්‍රියා |
|---|---|---|
| ගා | ගාපයති (ගයවයි) | ගායති/ගායතේ (ගයයි) |
| ස්‍රා | ස්‍රාපයති (සුවඳ කරවයි) | ජිස්‍රති/ජිස්‍රතේ (සුවඳ දෙයි) |
| ඥා | ඥාපයති (දන්වයි) | ජානාති/ජානීතේ (දැනගනියි) |
| දා | දාපයති (දෙවයි) | දදාති/දත්තේ (දෙයි) |
| ධ්මා(ධම්) | -ධ්මාපයති (පිඹීම කරවයි) | ධමති (පිඹියි) |
| ධ්‍යා | ධ්‍යාපයති (ධ්‍යාන කරවයි) | ධ්‍යායති/ධ්‍යායතේ (ධ්‍යාන කරයි) |
| ධා | ධාපයති (තබවයි) | දධාති/ධත්තේ (තබයි) |
| භා | භාපයති (බබළවයි) | භාති (බබළයි) |
| මා | මාපයති (මැනීම කරවයි) | මිමීතේ/මාති |
| යා | යාපයති (යවයි) | යාති (යයි) |
| ශා | හාපයති (හැරදමවයි) | ජහාති (හැරදමයි) |
| ස්ථා | ස්ථාපයති (සිටගන්වයි) | තිෂ්ඨති (සිටගනියි) |

- එහෙත් පානාර්ථ පා ධාතුවෙන් පරව 'ය්' යන්නද, රක්ෂාණාර්ථ පා ධාතුවෙන් පරව 'ල්' යන්න ද යෙදේ.

| | | |
|---|---|---|
| පා | පායය | පායයති (පොවයි) |
| පා | පාලය | පාලයති (රක්වයි/පාලනය කරවයි) |

*2. ව්‍යඤ්ජනාන්ත ධාතුන්ගේ මුල් (මධ්‍යස්ථ) ස්වරය 'ආ, ඊ, ඌ' නම් වෙනසකට පත්නොවේ.*

| ධාතුව | ණිජන්ත | ලට් ලකාර |
|---|---|---|
| ආස් | ආසයති (හිඳවයි) | ආස්තේ (හිඳියි) |
| කාංශ් | කාංශයති (කැමැති කරවයි) | කාංශති/කාංශතේ (කැමැතිවේ) |
| කූජ් | කූජයති (නාද කරවයි) | කූජති/කූජතේ (හඬයි) |
| ඛාද් | ඛාදයති (කවයි) | ඛාදති (කයි) |
| ගාහ් | ගාහයති (කිමිදීම කරවයි) | ගාහතේ (කිමිදේ) |
| ජීව් | ජීවයති (ජීවත් කරවයි) | ජීවති/ජීවතේ (ජීවත්වේ) |
| දීප් | දීපයති (බබලවයි) | දීප්‍යති/දීප්‍යතේ (බබළයි) |
| පූර් | පූරයති (පුරවයි) | පූරති/පූරතේ (පිරෙයි) |
| භාස් | භාසයති (බබලවයි) | භාසති/භාසතේ (බබළයි) |
| යාච් | යාචයති (සිඟා කවයි) | යාචති/යාචතේ (ඉල්ලයි) |
| රාධ් | රාධයති (වර්ධනය කරවයි) | රාධ්නෝති/රාධ්‍යතේ (වර්ධනය වේ) |
| ශාස් | ශාසයති (අණදීම කරවයි) | ශාස්ති/ශාස්තේ (අණදෙයි) |
| සාධ් | සාධයති (සාදවයි) | සාධති/සාධතේ/සාධ්නෝති (සාදයි) |
| සේව් | සේවයති (සේවය කරවයි) | සේවතේ (සේවය කරයි) |
| හිංස් | හිංසයති (හිංසා කරවයි) | හිංසති/හිසතේ/හිනස්ති (හිංසා කරයි) |
| හ්ලාද් | හ්ලාදයති (සතුටු කරවයි) | හ්ලාදතේ (සතුටු වේ) |

ඉහත සියලුම ණිජන්ත ක්‍රියාවන්හි ආත්මනේ පදද නිර්මාණය වේ. එනම් ආසයතේ, කාංශයතේ වශයෙනි.



- ධාතුවේ ස්වරය 'ඍ' නම් එය 'ඊර්' බවට වෙනස් වේ. උදා.

| | | |
|---|---|---|
| කෘත් | කීර්තයති (වර්ණනා කරවයි) | කීර්තති/කීර්තතේ (වර්ණනා කරයි) |

*3. හ්වේ, දෝ, ශෝ, ඡෝ, සෝ, ව්‍යෙ, වේ ආදී ඇතැම් ධාතුන් ආකාරන්ත වූ කල්හි 'ය්' යන්නක් ආගම වේ.*

| ධාතුව | ආකාරාන්තවීම හා 'ය' ආගමවීම | ණිජන්තය | අර්ථය |
|---|---|---|---|
| ඡෝ | ඡායය | ඡායයති | සිඳුවයි |
| දෝ | දායය | දායයති | කඩවයි. |
| වේ | වායය | වායයති | සංවර කරවයි. |
| ව්‍යෙ | ව්‍යායය | ව්‍යායයති | සංවර කරවයි. |
| ශෝ | ශායය | ශායයති | මුවහත් කරවයි. |
| සෝ | සායය | සායයති | නස්වයි |
| හ්වේ | හ්වායය | හ්වායයති | කැඳවවයි. |

*4. විකල්ප වශයෙන් ඇතැම් ධාතුහු වෙනස් වෙති. ඒ අනුව*

(අ). ඇතැම් ධාතුන් ගුණවීම

(ආ). ධාතුවෙන් පසුව 'ප්, න්, ෂ්, ව් ආදිය ආගමවීම

(ඇ). ඇතැම් ධාතුන්වල අන්ත ව්‍යඤ්ජන ලොප්වීම

(ඈ). පසුව ණිජන්ත 'අය' ප්‍රත්‍යය එකතුවීම වශයෙනි. උදා.

| ධාතු | ණිජ: ක්‍රියාංග | ණිජන්ත ක්‍රියා | අර්ථය |
|---|---|---|---|
| ඍ | අර්පය | අර්පයති | පමුණුවයි |
| ක්නූය් | ක්නෝපය | ක්නෝපයති | තෙත් කරවයි |
| ක්ෂමාය් | ක්ෂමාපය | ක්ෂමාපයති | කම්පා කරවයි |
| ධූ | ධූනය | ධූනයති | කම්පා කරවයි |

| | | | |
|---|---|---|---|
| ප්‍රී | ප්‍රීණය | ප්‍රීණයති | පිණවයි |
| බ්ලී | බ්ලේපය | බ්ලේපයති | ගිවිස්වයි |
| භී → | භීෂය | භීෂයති | බිය ගන්වයි |
| → | භාපය | භාපයති | බිය ගන්වයි |
| → | භායය | භායයති | බිය ගන්වයි |
| රී | රේපය | රේපයති | වගුරුවයි |
| රුහ් | රෝපය | රෝපයති | සිටුවයි |
| ස්ඵායි | ස්ඵාවය | ස්ඵාවයති | වර්ධනය කරවයි |
| හ්‍රී | හ්‍රේපය | හ්‍රේපයති | ලජ්ජා කරවයි. |

5. සාරස්වතයෙහි ක්‍රියා මාත්‍රයක් ගම්‍යමාන වන කල්හි ණිජන්ත ක්‍රියාව නිර්මාණය වන බව ප්‍රකාශ කරයි. (ව්‍යාපාරමාත්‍රේ ඤිච්ක්තව්‍යඃ). උදාහරණයක් ලෙස 'හලයති' (හල ගෘහ්ණාති- නගුල ගන්වයි) දක්වයි. ශ්‍රී පියරතන නාහිමි දක්වන්නේ මේ ව්‍යාකරණ නීතිය නාමධාතුක ප්‍රක්‍රියාවට අයත් විය යුතු බවයි. එම ප්‍රකාශයෙහි සාධාරණත්වයක් පවතී.

ඉහත විස්තර අනුව පැහැදිලි වන්නේ කිසියම් ක්‍රියාවක් කිරීමට අනිකෙකු යොදවයි නම් හෝ නියෝග දීමක් සිදුකරයි නම් ඊට යොදන ක්‍රියාව ණිජන්ත බවයි. උදා.

1. සඃ ග්‍රාමං ගච්ඡති- ඔහු ගමට යයි.
   සඃ තං ග්‍රාමං ගමයති- ඔහු ඒ තැනැත්තා ගමට යවයි.
2. ගුරුඃ පාඨං පඨති- ගුරුවරයා පාඩම පාඩම් කරයි.
   ගුරුඃ ශිෂ්‍යෙණ පාඨං පාඨයති- ගුරුවරයා ශිෂ්‍යයා ලවා පාඩම පාඩම් කරවයි.

සාමාන්‍යයෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙන් නිර්මාණය වන වාක්‍යයෙහි කර්තෘ පද දෙකක් යෙදේ. එනම් සාමාන්‍ය කර්තෘ හා ශුද්ධ කර්තෘ වශයෙනි. මෙහි ශුද්ධ කර්තෘ යනු ප්‍රධාන වශයෙන් ක්‍රියාව කරන්නායි. එසේම එය තෘතියා විභක්තියෙන් යෙදේ. ඉහත



උදාහරණයන්හි තේන, ගුරුණා නිදර්ශනයි. එම විභක්තියේ අර්ථය ගැන්වීමේදී 'ලවා' යන අර්ථය යෙදීම සිදුවේ. උදා. ගුරුඃ දාසේන කර්මං කාරයති- ගුරුවරයා දාසයා ලවා වැඩය කරවයි. දාසඃ කර්මං කරෝති සහ දාසේන කර්මං කාරයති යන වාක්‍යවලැ වෙනස පැහැදිලි වේ. සාමාන්‍ය කර්තෘ නම් ක්‍රියාව කරවන්නායි.

ණිජන්ත ක්‍රියාවන් දශ ලකාරයෙහිම වරනැගිය හැකි බව ද සැලකිය යුතුවේ. එබැවින් ණිජන්ත භූ ධාතුවේ දශ ලකාර රූපයන් මෙසේ දැක්විය හැක.

| ලකාර | පර.පද.ප්‍ර.පු.ඒක. | ආත්.පද.ප්‍ර.පු.ඒකඃ | අර්ථය |
|---|---|---|---|
| ලට් | භාවයති | භාවයතේ | සිදුකරවයි |
| ලඞ් | අභාවයත් | අභාවයත | සිදුකරවීය |
| ලෝට් | භාවයතු | භාවයතාම් | සිදුකෙරේවා |
| විධිලි. | භාවයේත් | භාවයතේ | සිදුකරවිය යුත්තේය |
| ලිට් | භාවයාමාස/භාවයාම්බභූව/ භාවයාඤ්චකාර | භාවයාඤ්චක්‍රේ | සිදුකරවීය |
| ලුට් | භාවයිතා | භාවයිතා | සිදුකරවන්නේය |
| ලෘට් | භාවයිෂ්‍යති | භාවයිෂ්‍යතේ | සිදුකරවන්නේය |
| ආශිර්. | භාව්‍යාත් | භාවයිෂ්ට | සිදුකෙරේවා |
| ලුඞ් | අබීභවත් | අබීභවත | සිදුකරවීය |
| ලෘඞ් | අභාවයිෂ්‍යත් | අභාවයිෂ්‍යත් | සිදුකරවූයේ නම්/ වන්නේ නම් |

ණිජන්ත ආඛ්‍යාත භාවිතය පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| ප්‍රී | ප්‍රීණය | ප්‍රීණයති | පිණවයි |
| බ්ලී | බ්ලේපය | බ්ලේපයති | ගිවිස්වයි |
| භී | භීෂය | භීෂයති | බිය ගන්වයි |
| | භාපය | භාපයති | බිය ගන්වයි |
| | භායය | භායයති | බිය ගන්වයි |
| රී | රේපය | රේපයති | වගුරුවයි |
| රුහ් | රෝපය | රෝපයති | සිටුවයි |
| ස්ඵායි | ස්ඵාවය | ස්ඵාවයති | වර්ධනය කරවයි |
| හ්‍රී | හ්‍රේපය | හ්‍රේපයති | ලජ්ජා කරවයි. |

5. සාරස්වතයෙහි ක්‍රියා මාත්‍රයක් ගම්‍යමාන වන කල්හි ණිජන්ත ක්‍රියාව නිර්මාණය වන බව ප්‍රකාශ කරයි. (ව්‍යාපාරමාත්‍රේ ණිද්වක්තව්‍යඃ). උදාහරණයක් ලෙස 'හලයති' (හල ගෘහ්ණාති- නගුල ගන්වයි) දක්වයි. ශ්‍රී පියරතන නාහිමි දක්වන්නේ මේ ව්‍යාකරණ නීතිය නාමධාතුක ප්‍රක්‍රියාවට අයත් විය යුතු බවයි. එම ප්‍රකාශයෙහි සාධාරණත්වයක් පවතී.

ඉහත විස්තර අනුව පැහැදිලි වන්නේ කිසියම් ක්‍රියාවක් කිරීමට අනිකෙකු යොදවයි නම් හෝ නියෝග දීමක් සිදුකරයි නම් ඊට යොදන ක්‍රියාව ණිජන්ත බවයි. උදා.

1. සඃ ග්‍රාමං ගච්ඡති- ඔහු ගමට යයි.
   සඃ තං ග්‍රාමං ගමයති- ඔහු ඒ තැනැත්තා ගමට යවයි.
2. ගුරුඃ පාඨං පඨති- ගුරුවරයා පාඩම පාඩම් කරයි.
   ගුරුඃ ශිෂ්‍යෙණ පාඨං පාඨයති- ගුරුවරයා ශිෂ්‍යයා ලවා පාඩම පාඩම් කරවයි.

සාමාන්‍යයෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියාවෙන් නිර්මාණය වන වාක්‍යයෙහි කර්තෘ පද දෙකක් යෙදේ. එනම් සාමාන්‍ය කර්තෘ හා ශුද්ධ කර්තෘ වශයෙනි. මෙහි ශුද්ධ කර්තෘ යනු ප්‍රධාන වශයෙන් ක්‍රියාව කරන්නායි. එසේම එය තෘතියා විභක්තියෙන් යෙදේ. ඉහත



උදාහරණයන්හි තේන, ගුරුණා නිදර්ශනයි. එම විභක්තියේ අර්ථය ගැන්වීමේදී 'ලවා' යන අර්ථය යෙදීම සිදුවේ. උදා. ගුරුඃ දාසේන කර්මං කාරයති- ගුරුවරයා දාසයා ලවා වැඩය කරවයි. දාසඃ කර්මං කරෝති සහ දාසේන කර්මං කාරයති යන වාක්‍යවලැ වෙනස පැහැදිලි වේ. සාමාන්‍ය කර්තෘ නම් ක්‍රියාව කරවන්නායි.

ණිජන්ත ක්‍රියාවන් දශ ලකාරයෙහිම වරනැගිය හැකි බව ද සැලකිය යුතුවේ. එබැවින් ණිජන්ත භූ ධාතුවේ දශ ලකාර රූපයන් මෙසේ දැක්විය හැක.

| ලකාර | පර.පද.ප්‍ර.පු.ඒක. | ආත්.පද.ප්‍ර.පු.ඒකඃ | අර්ථය |
|---|---|---|---|
| ලට් | භාවයති | භාවයතේ | සිදුකරවයි |
| ලඞ් | අභාවයත් | අභාවයත | සිදුකරවීය |
| ලෝට් | භාවයතු | භාවයතාම් | සිදුකෙරේවා |
| විධිලි. | භාවයේත් | භාවයතේ | සිදුකරවිය යුත්තේය |
| ලිට් | භාවයාමාස/භාවයාම්බභූව/ භාවයාඤ්චකාර | භාවයාඤ්චක්‍රේ | සිදුකරවීය |
| ලුට් | භාවයිතා | භාවයිතා | සිදුකරවන්නේය |
| ලෘට් | භාවයිෂ්‍යති | භාවයිෂ්‍යතේ | සිදුකරවන්නේය |
| ආශිර්. | භාව්‍යාත් | භාවයිෂ්ට | සිදුකෙරේවා |
| ලුඞ් | අබීභවත් | අබීභවත | සිදුකරවීය |
| ලෘඞ් | අභාවයිෂ්‍යත් | අභාවයිෂ්‍යත් | සිදුකරවූයේ නම්/ වන්නේ නම් |

ණිජන්ත ආඛ්‍යාත භාවිතය පහත සඳහන් පරිදි වේ.

1. කර්තෘ කාරකයේදී:

✓ ඇතැම් අකර්මක ක්‍රියා ණිජන්ත ක්‍රියාවීමෙන් පසු සකර්මක වේ. කර්මය ද්විතීයා විභක්තිය ගනී. උදා. අහං තාම් තෝෂයාමි- මම ඇය සතුටු කරවමි.

✓ ඇතැම් සකර්මක ධාතූන්ගේ අර්ථ කිසිදු වෙනසක් නොමැතිව එම අර්ථම ප්‍රකාශ කරයි. (මේවා බොහෝ විට 10 වැනි ධාතු ගණයේ හෝ වෙනත් ගණයක යෙදීමේ භේදය පමණක් පෙන්වයි.)

උදා. ප්‍රී- ප්‍රීණාති/ ප්‍රීණයති- පිනවයි

පුෂ්- පුෂ්‍යාති/පෝෂයති- පෝෂණය කරවයි.

✓ සකර්මක ධාතුවක් ණිජන්ත ක්‍රියාවක් බවට පත් වූ විට වාක්‍යයේ උක්තය තෘතීයාවෙන් ද, වාක්‍යයේ කර්මය ද්විතියාවෙන් ද යෙදේ. ඉහත දැක් වූ පරිදි තෘතීයාවෙන් යෙදෙන පදය අර්ථය ගැන්වීමේදී 'ලවා' යන සිංහල නිපාතය යෙදේ. උදා.

1. ශුද්ධ ක්‍රියාව: දාසඃ කර්මං කරෝති- දාසයා වැඩය කරයි.

   ණිජන්ත ක්‍රියාව: ගුරුඃ දාසේන කර්මං කාරයති- ගුරුවරයා දාසයා ලවා වැඩය කරවයි.

2. ශුද්ධ ක්‍රියාව: සඃ දානං දදති- ඔහු දානය දෙයි.

   ණිජන්ත ක්‍රියාව: අහං තේන දානං දාපයාමි.- මම ඔහු ලවා දානය දෙවමි.

3. ශුද්ධ ක්‍රියාව: දුහිතා ඕදනං පචති- දුව බත පිසයි.

   ණිජන්ත ක්‍රියාව: මාතා දුහිත්‍රා ඕදනං පාචයති- මව දුව ලවා බත පිසවයි.



✓ ද්වි කර්මක ධාතුවක් ණිජන්ත ක්‍රියාවක් වූ කළ වාක්‍යයක කර්ම දෙකම ද්විතීයාවෙන් යෙදේ. උදා.

ශුද්ධ ක්‍රියාව: යාචකඃ රාජානං ධනං යාචති- දිළින්දා රජුගෙන් ධනය ඉල්ලයි.

ණිජන්ත ක්‍රියාව: ප්‍රභු යාචකේන රාජානං ධනං යාචයති- ස්වාමියා දිළින්දා ලවා රජුගෙන් ධනය ඉල්වයි.

**ණිජන්ත පූර්ව ක්‍රියා හා තුමර්ථ:**

එසේම ණිජන්ත ක්‍රියාවෙන් නිර්මාණය වන පූර්ව ක්‍රියා හා තුමන්ත (තාදර්ථ්‍ය) ක්‍රියා පිළිබඳව ද විස්තර සොයා බැලීම ප්‍රයෝජනවත් වේ. එහි විශේෂතා මෙසේය. ණිජන්ත ක්‍රියා අංගයේ අන්ත 'අ' යන්න ලොප් වී උපකාරක 'ඉ' ස්වරය ආගම වේ.

✓ 'ත්වා' යන ප්‍රත්‍යය පූර්ව ක්‍රියා සඳහා එකතුවීම

උදා. ගමය+ඉ+ති= ගමය්+ඉ+ත්වා= ගමයිත්වා-යවා (පූර්ව ක්‍රියාවයි)

✓ 'තුං' යන ප්‍රත්‍යය තුමර්ථ සඳහා එකතුවීම

ගමය+ඉ+තුං=ගමය්+ඉ+තුං=ගමයිතුං-යවන්නට (තාදර්ථ්‍යයි)

✓ ධාතුවේ ස්වර ගුණවීම හා වෘද්ධිවීම ද සිදුවේ.

පහත සඳහන් උදාහරණයන් වැඩිදුර අවබෝධය පිණිස හේතු වේ.

| ධාතුව | ණිජ: ක්‍රියාංග | ණිජ:- වර්ත: | ණිජ: පූර්ව ක්‍රියාව | ණිජ: තාදර්ථ්‍ය |
|---|---|---|---|---|
| කෘ | කාරය | කාරයති | කාරයිත්වා-කරවා | කාරයිතුං-කරවන්නට |
| ගම් | ගමය | ගමයති | ගමයිත්වා-යවා | ගමයිතුං-යවන්නට |
| දා | දාපය | දාපයති | දාපයිත්වා-දෙවා | දාපයිතුං-දෙවන්නට |
| නෘත් | නර්තය | නර්තයති | නර්තයිත්වා-නටවා | නර්තයිතුං-නැටවීමට |

| | | | | |
|---|---|---|---|---|
| පච් | පාචය | පාචයති | පාචයිත්වා-පිසවා | පාචයිතුං-පිසවන්නට |
| බුධ් | බෝධය | බෝධයති | බෝධයිත්වා-දන්වා | බෝධයිතුං-දන්වන්නට |
| භී | භායය | භායයති | භායයිත්වා-බිය කරවා | භායයිතුං-බිය කරවන්නට |
| භූ | භාවය | භාවයති | භාවයිත්වා-සිදුකරවා | භාවයිතුං-සිදුකරවීමට |
| හෘ | හාරය | හාරයති | හාරයිත්වා-ගෙනයවා | හාරයිතුං-ගෙන යවන්නට |

✓ පූර්ව ක්‍රියා රූප සෑදීමේදී ධාතුවට මුලින් උපසර්ගයක් යෙදී ඇත්නම් පූර්ව ක්‍රියා ප්‍රත්‍යය වන්නේ 'ය' යන්නයි. එහිදී ණිජන්ත ක්‍රියාංගයේ 'අය' යන්න ලොප් වේ. උදා.

| උප: හා ධාතු | ණිජ: ක්‍රියාංග | ණිජ: පූර්ව ක්‍රියා | ශුද්ධ පූර්ව ක්‍රියා |
|---|---|---|---|
| වි+භජ් | විභාජය | විභාජ්‍ය-බෙදවා | විභජ්‍ය-බෙදා |
| වි+ආ+පද් | ව්‍යාපාදය | ව්‍යාපාද්‍ය- මරවා | ව්‍යාපද්‍ය- මරා |
| පරි+නී | පරිණායය | පරිණාය්‍ය-විවාහකරවා | පරිණීය- විවාහ වී |
| අව+ස්ථා | අවස්ථාපය | අවස්ථාප්‍ය-පත්කිරීමෙහි | අවස්ථාය- පත්කොට |

✓ ඉහත දැක් වූ ක්‍රමයට වෙනස්ව ද පූර්ව ක්‍රියා සෑදේ. එනම් ණිජන්ත ක්‍රියාංගයේ අවසන් 'අ' යන්න පමණක් ලොප් වී 'ය' ප්‍රත්‍යය එකතුවේ. උදා.

| උප: හා ධාතු | ණිජ: ක්‍රියාංග | ණිජ: පූර්ව ක්‍රියා | ශුද්ධ පූර්ව ක්‍රියා |
|---|---|---|---|
| සම්+ක්‍රම් | සම්ක්‍රමය (ය්+අ) | සම්ක්‍රමය්‍ය(පමුණුවා) | සම්ක්‍රම්‍ය- පැමිණ |
| අව+ගම් | අවගමය (ය්+අ) | අවගමය්‍ය(දන්වා) | අවගම්‍ය- දැන |
| ප්‍ර+ජන් | ප්‍රජනය (ය්+අ) | ප්‍රජනය්‍ය(උපදවා) | ප්‍රජන්‍ය- උපදවා |
| ප්‍ර+ජ්වල් | ප්‍රජ්වලය (ය්+අ) | ප්‍රජ්වලය්‍ය(බබලවා) | ප්‍රජ්වල්‍ය-බැබළී |
| ප්‍ර+ශම් | ප්‍රශමය (ය්+අ) | ප්‍රශමය්‍ය(සන්සුන්කරවා) | ප්‍රශම්‍ය-සන්සුන්වී |
| වි+රච් | විරචය (ය්+අ) | විරචය්‍ය(රචනාකරවා) | විරච්‍ය- රචනය කර |
| ප්‍ර+ආප් | ප්‍රාපය (ය්+අ) | ප්‍රාපය්‍ය(පමුණුවා) | ප්‍රාප්‍ය- පැමිණ |



2. කර්මකාරකය:

✓ ණිජන්ත ක්‍රියාපදය යෙදෙන කර්මකාරක වාක්‍යයන්හි ශුද්ධ උක්තය ප්‍රථමා විභක්තියෙන් යෙදේ. එසේම කර්මපදය ද්විතීයා විභක්තියෙන් සාමාන්‍ය පරිදි යෙදේ. උදා.

1. ශුද්ධ කර්තෘකාරක ක්‍රියාව: දාසඃ කටං කරෝති (දාසයා පැදුරක් කරයි)

   ශුද්ධ කර්මකාරක: දාසේන කටං ක්‍රියතේ (දාසයා විසින් පැදුරක් කරනු ලැබේ)

   ණිජන්ත කර්තෘකාරක: ප්‍රභුඃ දාසේන කටං කාරයති (ස්වාමියා දාසයා ලවා පැදුරක් කරවයි)

   ණිජන්ත කර්ම: ප්‍රභුණා දාසඃ කටං කාර්‍යතේ (ස්වාමියා විසින් දාසයා ලවා පැදුරක් කරවනු ලැබේ)

2. ශුද්ධ කර්තෘකාරක ක්‍රියාව: භ්‍රාතා පුස්තකානි දදාති (සහෝදරයා පොත් දෙයි)

   ශුද්ධ කර්මකාරක: භ්‍රාතෘණා පුස්තකානි දීයන්තේ (සහෝදරයා විසින් පොත් දෙනු ලැබේ)

   ණිජන්ත කර්තෘ: භගිනී භ්‍රාත්‍රා පුස්තකානි දාපයති (සහෝදරිය සහෝදරයා ලවා පොත් දෙවයි)

   ණිජන්ත කර්ම: භගින්‍යා භ්‍රාතා පුස්තකානි දාප්‍යන්තේ (සහෝදරිය විසින් සහෝදරයා ලවා පොත් දෙවනු ලැබෙත්)

   කර්මකාරක වාක්‍යවලදී කර්මය අනුව ක්‍රියාව තබනු ලැබේ.

ණිජන්ත කර්මකාරක ක්‍රියාව සෑදීම හා වරනැගීම මෙසේය.

- ණිජන්ත කර්තෘකාරක ක්‍රියාංගය උදා. කාරය, ලේඛය, දාපය
- ණිජන්ත ප්‍රත්‍යයේ අවසන් ~~'අ'~~ ලොප් වේ.
  උදා. කාරය → කාර්ය් බවට පත්වීම
- ඇතැම් අවස්ථාවල ණිජන්ත ප්‍රත්‍යය (අය) සම්පූර්ණයෙන් ලොප්වීම
- පසුව කර්මකාරක 'ය' ප්‍රත්‍යය එකතුවීමඃ උදා. කාර්ය්+ය (කාර්ය්‍ය)
- ධාතුවේ ස්වරය ගුණවීම හෝ වෘද්ධිවීම
- ආත්මනේ පද ප්‍රත්‍යය එකතුවීම වශයෙනි.

පහත සඳහන් උදාහරණ මගින් පැහැදිලි වේ.

| ධාතුව | ණිජන්ත ක්‍රියාංගය | ණිජන්ත කර්මකාරක ක්‍රියාව |
|---|---|---|
| පච් | පාචය | පාච්+ය+තේ (පාච්‍යතේ- පිසවනු ලැබේ) |
| ලිඛ් | ලේඛය | ලේඛ්+ය+තේ (ලේඛ්‍යතේ- ලියවනු ලැබේ) |
| ගම් | ගමය | ගම්+ය+තේ (ගම්‍යතේ- යවනු ලැබේ) |
| බුධ් | බෝධය | බෝධ්+ය+තේ (බෝධ්‍යතේ- දන්වනු ලැබේ) |
| නෘත් | නර්තය | නර්ත්+ය+තේ (නර්ත්‍යතේ- නටවනු ලැබේ) |

✓ ණිජන්ත කර්මකාරකයේ දශලකාර මෙසේය.

| ලකාර | ප්‍ර.ඒක. | අර්ථය |
|---|---|---|
| ලට් | බෝධ්‍යතේ | දන්වනු ලැබේ |
| ලඞ් | අබෝධ්‍යත | දන්වනු ලැබිය |
| විධිලිː | බෝධ්‍යෙත | දන්වනු ලැබිය යුතුයි |
| ලෝට් | බෝධ්‍යතාම් | දන්වනු ලැබේවා |
| ලිට් | බෝධයාඤ්චක්‍රෙ- | දන්වනු ලැබිය |
| ආශිර්ලිː | බෝධයිෂීෂ්ට | දන්වනු ලැබේවා |
| ලුට් | බෝධයිතා | දන්වනු ලබන්නේය |
| ලෘට් | බෝධයිෂ්‍යතෙ | දන්වනු ලබන්නේය |
| ලෘඞ් | අබෝධයිෂ්‍යත | දන්වනු ලැබී නම්/ලබන්නේ නම් |
| ලුඞ් | අබෝධි | දන්වනු ලැබීය. |



දශලකාරයේම ණිජන්ත ක්‍රියා පද මෙතැන් සිට දක්වනු ලැබේ.

ණිජන්ත ලට්හි පර.පද. කර්තෘ වරනැගීමඃ

| පුරුෂ | ඒකඃ | ද්විඃ | බහුඃ |
|---|---|---|---|
| ප්‍රඃ | බෝධයති | බෝධයතඃ | බෝධයන්ති (දන්වති) |
| මඃ | බෝධයසි | බෝධයථඃ | බෝධයථ |
| උඃ | බෝධයාමි | බෝධයාවඃ | බෝධයාමඃ (දන්වමු) |

ණිජන්ත ලට්හි ආත්.පද. කර්තෘ වරනැගීමඃ

| පුරුෂ | ඒකඃ | ද්විඃ | බහුඃ |
|---|---|---|---|
| ප්‍රඃ | බෝධයතේ | බෝධයේතේ | බෝධයන්තේ (දන්වති) |
| මඃ | බෝධසේ | බෝධයේථේ | බෝධයධ්වේ |
| උඃ | බෝධයේ | බෝධයාවහේ | බෝධයාමහේ (දන්වමු) |

ණිජන්ත ලට්හි කර්මණි පදයේ වරනැගීමඃ

| පුරුෂ | ඒකඃ | ද්විඃ | බහුඃ |
|---|---|---|---|
| ප්‍රඃ | බෝධ්‍යතේ | බෝධ්‍යෙතේ | බෝධ්‍යන්තේ (දන්වනු ලැබෙති) |
| මඃ | බෝධ්‍යසේ | බෝධ්‍යෙථේ | බෝධ්‍යධ්වේ |
| උඃ | බෝධ්‍යෙ | බෝධ්‍යාවහේ | බෝධ්‍යාමහේ (දන්වනු ලැබෙමු) |

ණිජන්ත ලඞ්හි පර.පද. කර්තෘ වරනැගීමඃ

| පුරුෂ | ඒකඃ | ද්විඃ | බහුඃ |
|---|---|---|---|
| ප්‍රඃ | අබෝධයත් | අබෝධයතාම් | අබෝධයන් (දැන්වූහ) |
| මඃ | අබෝධයඃ | අබෝධයතම් | අබෝධයථ |
| උඃ | අබෝධයම් | අබෝධයාව | අබෝධයාම (දන්වීමු) |

ණිජන්ත ලඬ්හි ආත්.පද. කර්තෘඃ වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | අබෝධයත | අබෝධයේතාම් | අබෝධයන්ත (දැන්වූහ) |
| ම: | අබෝධයථාඃ | අබෝධයේථාම් | අබෝධයධ්වම් |
| උ: | අබෝධයේ | අබෝධයාවහි | අබෝධයාමහි (දන්වීමු) |

ණිජන්ත ලඬ්හි (අනද්‍යතන) කර්මණි පදයේ වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | අබෝධ්‍යත | අබෝධ්‍යෙතාම් | අබෝධ්‍යන්ත (දන්වනු ලබන ලදහ) |
| ම: | අබෝධ්‍යථාඃ | බෝධ්‍යෙථාම් | අබෝධ්‍යධ්වම් |
| උ: | අබෝධ්‍යෙ | අබෝධ්‍යාවහේ | අබෝධ්‍යාමහේ (දන්වනු ලැබුවෙමු) |

ණිජන්ත විධිලිඬ්හි පර.පද. කර්තෘඃ වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | බෝධයේත් | බෝධයේතාම් | බෝධයේයුඃ (දනවන්නෝය) |
| ම: | බෝධයේඃ | බෝධයේතම් | බෝධයේත |
| උ: | බෝධයේයම් | බෝධයේව | බෝධයේම (දනවන්නෙමු) |

ණිජන්ත විධිලිඬ්හි ආත්.පද. කර්තෘඃ වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | බෝධයේත | බෝධයේයාතාම් | බෝධයේරන් (දනවන්නෝය) |
| ම: | බෝධයේථාඃ | බෝධයේයාථාම් | බෝධයේධ්වම් |
| උ: | බෝධයේය | බෝධයේවහි | බෝධයේමහි (දනවන්නෙමු) |



ණිජන්ත විධිලිඬ්හි කර්මණි පදයේ වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | බෝධ්‍යෙත | බෝධ්‍යෙයාතාම් | බෝධ්‍යෙරන් (දන්වනු ලැබෙති) |
| ම: | බෝධ්‍යෙථාඃ | බෝධ්‍යෙයාථාම් | බෝධ්‍යෙධ්වම් |
| උ: | බෝධ්‍යෙය | බෝධ්‍යෙවහි | බෝධ්‍යෙමහි (දන්වනු ලැබෙමු) |

ණිජන්ත ලෝට් පර.පද. කර්තෘඃ වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | බෝධයතු/ බෝධයතාත් | බෝධයතාම් | බෝධයන්තු (දන්වත්වා) |
| ම: | බෝධය/ බෝධයතාම් | බෝධයතම් | බෝධයත |
| උ: | බෝධයානි | බෝධයාව | බෝධයාම (දන්වමුවා) |

ණිජන්ත ලෝට් ආත්.පද. කර්තෘඃ වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | බෝධයතාම් | බෝධයේතාම් | බෝධයන්තාම් (දන්වත්වා) |
| ම: | බෝධයස්ව | බෝධයේථාම් | බෝධයධ්වම් |
| උ: | බෝධයෛ | බෝධයාවහෛ | බෝධයාමහෛ (දන්වමුවා) |

ණිජන්ත ලෝට් පර.පද. කර්මණි පදයේ වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | බෝධ්‍යතාම් | බෝධ්‍යෙතාම් | බෝධ්‍යන්තාම් (දන්වනු ලැබෙත්වා) |
| ම: | බෝධ්‍යස්ව | බෝධ්‍යෙථාම් | බෝධ්‍යධ්වම් |
| උ: | බෝධ්‍යෛ | බෝධ්‍යාවහෛ | බෝධ්‍යාමහෛ (දන්වනු ලැබෙමුවා) |

පරෝක්ෂා ලිට් ණිජන්ත ක්‍රියාව වරනැගීම: එම ක්‍රියාව සාදා ගැනීමේදී පහත ක්‍රියා පිළිවෙල අනුගමනය කරනු ලැබේ.

- ★ ණිජන්ත ක්‍රියාංගය නාමයක ද්විතීයාවක් බවට පැමිණවීම: උදා. කාරයාම්, ලේඛයාම්, පාචයාම්
- ★ එම ද්විතීයා නාමයට උපකාරක ක්‍රියාවක් එකතු කිරීම: උදා. ආස, චකාර, බභූව
- ★ එම ක්‍රියා පද පරස්මෛ පද හා ආත්මනේ පද දෙවර්ගයෙහිම වරනැගේ.
- ★ මෙම පරෝක්ෂා ලිට් ලකාරය පර්‍යායෝක්තිමය පරෝක්ෂායැයි කියනු ලැබේ. එම ක්‍රියා පදයේ සාමාන්‍ය අර්ථය වන්නේ 'කිරීමක් විය, යෑමක් විය, ලිවීමක් විය' වැනි අර්ථයි.

සාමාන්‍ය පර්‍යායෝක්තිමය පරෝක්ෂාව ද්විත්ව ලිට් පරෝක්ෂාවෙන් වෙනස් වේ. ද්විත්ව පරෝක්ෂාව සිදුවන්නේ එකම වචනයක් තුළ ද්විත්වවීමයි. එනම් චකමේ, චකර්ෂ, බභූව, චකාර ආදී වශයෙනි. එහෙත් පර්‍යායෝක්ති පරෝක්ෂාවට පද දෙකක් සම්බන්ධ වේ. උදා.

| ධාතුව | ක්‍රියාංගය-ද්විතීයා | උපකාරක ක්‍රියාව | ප්‍ර.පු.ඒක. |
|---|---|---|---|
| කෘ | කාරයාං | ආස | කාරයාමාස (කරවීය) |
| බුධ් | බෝධයාං | චකාර | බෝධයාංචකාර (දැන්වීය) |
| චුර් | චෝරයාං | බභූව | චොරයාම්බභූව (සොරකම වීය) |

ණිජන්ත ලිට්හි පරඃ පදඃ වරනැගීම:

| පුරුෂ | ඒකඃ | ද්විඃ | බහුඃ |
|---|---|---|---|
| ප්‍රඃ | බෝධයාමාස | බෝධයාමාසතුඃ | බෝධයාමාසුඃ (දැන්වූහ/දැන්වීම කළහ) |
| මඃ | බෝධයාමාසිථ | බෝධයාමාසථුඃ | බෝධයාමාස |
| උඃ | බෝධයාමාස | බෝධයාමාස්ව | බෝධයාමාස්ම (දැන්වීමු/දැන්වීම කළෙමු) |



ණිජන්ත ලිට්හි ආත්ඃ පදඃ වරනැගීම:

| පුරුෂ | ඒකඃ | ද්විඃ | බහුඃ |
|---|---|---|---|
| ප්‍රඃ | බෝධයාඤ්චක්‍රෙ | බෝධයාඤ්චක්‍රාතේ | බෝධයාඤ්චක්‍රිරේ |
| මඃ | බෝධයාඤ්චකෘෂේ | බෝධයාඤ්චක්‍රාථේ | බෝධයාඤ්චකෘඪ්වේ |
| උඃ | බෝධයාඤ්චක්‍රෙ | බෝධයාඤ්චකෘවහේ | බෝධයාඤ්චකෘමහේ |

- ★ ණිජන්ත ලිට්හි කර්මණි පදයේ වරනැගීම: පෙර සඳහන් ආත්මනේ පදයම යොදා ගැනේ. ඊට විශේෂ වරනැගීමක් නැත. එසේම චක්‍රේ යන උපකාරක ක්‍රියාව වෙනුවට ආස, බභූව ආදිය ද යොදා ගත හැක.

ණිජන්ත ලෘට්හි (අනාගත) පර.පද. කර්තෘ වරනැගීම:

මෙහිදී ණිජන්ත ක්‍රියාංගයේ අන්ත 'අ' ලොප් වේ. අනතුරුව 'ඉ' යන්න සමග ලෘට් තිඞන්ත ප්‍රත්‍යය එකතු වේ. උදා. බෝධය+ඉ+ ෂ්‍යති- බෝධයිෂ්‍යති.

| පුරුෂ | ඒකඃ | ද්විඃ | බහුඃ |
|---|---|---|---|
| ප්‍රඃ | බෝධයිෂ්‍යති | බෝධයිෂ්‍යතඃ | බෝධයිෂ්‍යන්ති (මතු දන්වන්නෝය) |
| මඃ | බෝධයිෂ්‍යසි | බෝධයිෂ්‍යථඃ | බෝධයිෂ්‍යථ |
| උඃ | බෝධයිෂ්‍යාමි | බෝධයිෂ්‍යාවඃ | බෝධයිෂ්‍යාම (මතු දන්වන්නෙමු) |

ණිජන්ත ලෘට්හි (අනාගත) ආත්. පද. කර්තෘ වරනැගීම:

| පුරුෂ | ඒකඃ | ද්විඃ | බහුඃ |
|---|---|---|---|
| ප්‍රඃ | බෝධයිෂ්‍යතේ | බෝධයිෂ්‍යේතේ | බෝධයිෂ්‍යන්තේ (මතු දන්වන්නෝය) |
| මඃ | බෝධයිෂ්‍යසේ | බෝධයිෂ්‍යේථේ | බෝධයිෂ්‍යධ්වේ |
| උඃ | බෝධයිෂ්‍යෙ | බෝධයිෂ්‍යාවහේ | බෝධයිෂ්‍යාමහේ (මතු දන්වන්නෙමු) |

ණිජන්ත ලෘට්හි කර්මණි පදයේ වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | බෝධෛයෂ්‍යතේ | බෝධෛයෂ්‍යේතේ | බෝධෛයෂ්‍යන්තේ (මතු දන්වනු ලැබෙති) |
| ම: | බෝධෛයෂ්‍යසේ | බෝධෛයෂ්‍යේථේ | බෝධෛයෂ්‍යධ්වේ |
| උ: | බෝධෛයෂ්‍යෙ | බෝධෛයෂ්‍යාවහේ | බෝධෛයෂ්‍යාමහේ (මතු දන්වනු ලැබෙමු) |

ණිජන්ත ලුට්හි (අනාගත) පර. පද. කර්තෘ: වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | බෝධයිතා | බෝධයිතාරෞ | බෝධයිතාරඃ (හෙට දන්වන්නෝය) |
| ම: | බෝධයිතාසි | බෝධයිතාස්ථඃ | බෝධයිතාස්ථ |
| උ: | බෝධයිතාස්මි | බෝධයිතාස්වඃ | බෝධයිතාස්මඃ (හෙට දන්වන්නෙමු) |

ණිජන්ත ලුට්හි (අනාගත) ආත්. පද. කර්තෘ: වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | බෝධයිතා | බෝධයිතාරෞ | බෝධයිතාරඃ (හෙට දන්වන්නෝය) |
| ම: | බෝධයිතාසේ | බෝධයිතාසාථේ | බෝධයිතාධ්වේ |
| උ: | බෝධයිතාහේ | බෝධයිතාස්වහේ | බෝධයිතාස්මහේ (හෙට දන්වන්නෙමු) |

ණිජන්ත ලුට්හි (අනාගත) කර්මණි පදයේ වරනැගීම:

| පුරුෂ | ඒක: | ද්වි: | බහු: |
|---|---|---|---|
| ප්‍ර: | බෝධයිතා | බෝධයිතාරෞ | බෝධයිතාරඃ (හෙට දන්වනු ලබන්නේය) |
| ම: | බෝධයිතාසේ | බෝධයිතාසාථේ | බෝධයිතාධ්වේ |
| උ: | බෝධයිතාහේ | බෝධයිතාස්වහේ | බෝධයිතාස්මහේ (හෙට දන්වනු ලැබෙමු) |



පහත දක්වා ඇත්තේ දශ ධාතු ගණයට අයත් තිඞන්ත හා ණිජන්ත ක්‍රියා පදවල වර්තමාන රූපයෝය. ඒ සියල්ල තවදුරටත් අවබෝධය පිණිස හේතු වනු ඇත.

| ධාතුව | ලට් | ණිජන්ත: | අර්ථය: |
|---|---|---|---|
| භූ | භවති | භාවයති/භාවයතේ | සිදුකරවයි |
| පා | පිබති | පායයති/පායයතේ | පොවයි |
| දෘශ් | පශ්‍යති | දර්ශයති/දර්ශයතේ | පෙන්වයි |

2. අද් ගණය:

| | | | |
|---|---|---|---|
| අද් | අත්ති | ආදයති/ආදයතේ | කවයි |
| රුද් | රෝදති | රෝදයති/රෝදයතේ | හඬවයි |
| ඉ | ඒති | ගමයති/ගමයතේ | යවයි |
| ශී | ශේතේ | ශායයති/ශායයතේ | නිදිකරවයි |
| දුහ් | දෝග්ධි | දෝහයති/දෝහයතේ | දොවයි |
| බ්‍රෑ | බ්‍රවීති/බ්‍රෑතේ | වාචයති/වාචයතේ | කියවයි |

3. ජුහෝත්‍යාදි ගණය:

| | | | |
|---|---|---|---|
| හු | ජුහෝති | හාවයති/හාවයතේ | යාග කරවයි |
| දා | දදාති | දාපයති/දාපයතේ | දෙවයි |

4. දිවාදි ගණය:

| | | | |
|---|---|---|---|
| දිව් | දීව්‍යති | දේවයති/දේවයතේ | ක්‍රීඩා කරවයි |
| නෘත් | නෘත්‍යති | නර්තයති/නර්තයතේ | නටවයි |

5. ස්වාදි ගණය:

| | | | |
|---|---|---|---|
| සු | සුනෝති | සාවයති/සාවයතේ | පෙරවයි |
| ආප් | ආප්නෝති | ආපයති/ආපයතේ | පමුණුවයි |

6. තුදාදි ගණය:

| | | | |
|---|---|---|---|
| තුද් | තුදති | තෝදයති/තෝදයති | පෙළවයි |
| මෘ | ම්‍රියතේ | මාරයති/මාරයතේ | මරවයි |

7. රුධාදි ගණය:

| | | | |
|---|---|---|---|
| රුද් | රුණද්ධි/ රුන්ධෙ. | රෝධයති/රෝද්‍යතේ | වළක්වයි |
| කෘ | කරෝති | කාරයති/කාරයතේ | කරවයි |

8. තනාදි ගණය:

| | | | |
|---|---|---|---|
| තන් | තනෝති | තානයති/තානයතේ | දිගහරියි |
| මන් | මන්‍යති/ මන්‍යතේ, | මානයති/මානයතේ | කල්පනා කරවයි |

9. ක්‍රියාදි ගණය:

| | | | |
|---|---|---|---|
| ක්‍රී | ක්‍රීණාති | ක්‍රාපයති/ක්‍රාපයතේ | මිළට ගන්වයි |
| ඥා | ජානාති | ඥාපයති/ඥාපයතේ | දන්වයි |

10. චුරාදි ගණය:

| | | | |
|---|---|---|---|
| චුර් | චෝරයති/ චෝරයතේ, | චෝරයති/චෝරයතේ, | සොරකම් කරවයි |
| භක්ෂ් | භක්ෂයති/ භක්ෂයතේ, | භක්ෂයති/භක්ෂයතේ | අනුභව කරවයි |

සංස්කෘත ව්‍යාකරණ අධ්‍යයනයේදී පමණක් නොව සංස්කෘත භාෂා භාවිතයේදී ද ණිජන්ත ක්‍රියාවන්හි උපයෝගීතාව සුවිශේෂ වේ. එනම් ඕනෑම සමාජයකදී නියෝගයන් හා මෙහෙයවීම් (Orders/ Commands) බහුල වශයෙන් සිදුවන බැවිනි.



## ආශ්‍රිත ග්‍රන්ථ


සාරස්වත (සවිස්තර චතුර්ථ භාගය). (පරි.). බද්දේගම ශ්‍රී පියරතන මාහිමි. කලුතර: විද්‍යාතිලක මුද්‍රණාලය. 1941. පි. 141-157

ජයසූරිය, එම්.එච්.එෆ්. සංස්කෘත ශික්ෂකය -ද්විතීය පුසතක. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. 1971. පි. 190-204 බලන්න

ධම්මින්ද නාහිමි, හෑගොඩ. සංස්කෘත ව්‍යාකරණ තරඞ්ගිණී (ආඛ්‍යාත). කොළඹ: විද්‍යෝදය පිරිවෙණේ ආදි ශිෂ්‍ය සංගමය. 1999. පි. 336-340

ධම්මින්ද නාහිමි, හෑගොඩ. සංස්කාත පාඨාවලී. කොළඹ: විද්‍යෝදය පිරිවෙණේ ආදි ශිෂ්‍ය සංගමය. 1998. පි. 56-61

පුඤ්ඤානන්ද හිමි, කඳානේගෙදර. සංස්කෘත ව්‍යාකරණ ශික්ෂා. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. 1961. පි. 125-127

පේමරතන හිමි, වරාගොඩ. සංස්කෘත නාමාඛ්‍යාත විවරණය. කෙළඹ: සමයවර්ධන පොත්හල (පුද්). 2004. පි. 177- 183

සේනාධීර, ගුණපාල (පරි.). ආධුනික සංස්කෘත ව්‍යාකරණය. කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව. 1964. පි. 139-140

Macdonell, A. Arthur. A Sanskrit Grammar for Students. India: Motilal Banarsidas Publishers. 1997. P. 139-140